ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2023-01-09

පැමිණිලි පාර්ශවය : එම්.කේ.එල්.ඩබ්ලිව්. සමන්මලි මිය,
අංක. 517, තේක්කවත්ත,
තඹුත්තේගම.

වගඋත්තර පාර්ශවය : උප පොලිස් පරික්ෂක - ඒ.එම්. පියතිස්ස මයා,
විවිධ පැමිණිලි අංශය,
මූලස්ථාන පොලිසිය,
තඹුත්තේගම.

**පැමිණිලි අංකය : HRC/AP/594/2016(S)**

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2016.09.19 වන දින පැමිණිලිකාරියට සිදුවූ පහරදීමක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් කිරීම සඳහා වගඋත්තරකාර පොලිස් ස්ථානය වෙත ගිය බවත්, එසේ පැමිණිලිකර දින 02 ක් රෝහල් ගතව සිටි බවත්, පසුව තමා විසින් ඉහත දින පොලිසිය වෙත කරන ලද පැමිණිල්ල අසත්‍ය පැමිණිල්ලක් බව පවසා පැමිණිලිකාරියට එරෙහිව ගරු අධිකරණය වෙත කරුණු වාර්තා කර අසාධාරණයක් සිදුකර ඇති බවත්ය. එසේම තමා විසින් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් කිසිදු විභාගයක් සිදුනොකළ බවද සඳහන් කර ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් වගඋත්තරකරු 2016.11.29 දින කොමිෂන් සභාව වෙත වාර්තාවක් යොමු කරමින් ප්‍රකාශ කර ඇත්තේ, මෙම පැමිණිලිකාරිය 2016.09.19 වන දින 331/252 යටතේ පහරදීමට තැත්කිරීමක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවත්, අනතුරුව මෙම පැමිණිලිකාරිය 2016.09.20 දින තඹුත්තේගම රෝහලට ඇතුළත්ව ඇති බවත්ය. එමෙන්ම පැමිණිලිකාරියගෙන් තඹුත්තේගම රෝහල් පොලිසිය විසින් නැවත ප්‍රකාශයක් ලබාගෙන ඇති බවත්, පැමිණිලිකාරිය වෙත අංක 655/16 දරණ අධිකරණ වෛද්‍ය පරික්ෂණ පෝරමය නිකුත් කර ඇති බවත්, දක්වා ඇත. ඒ අනුව මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් 2016.09.20 දින



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

විමර්ශනයක් සිදුකර ඇති අතර, එම විමර්ශනයේදී පැමිණිලිකාරිය පවසන ආකාරයේ සිදුවීමක් සිදුව නොමැති බවට අනාවරණය වූ බවත් දක්වා ඇත. එමෙන්ම පැමිණිලිකාරිය විසින් පොලිසිය වෙත යොමු කර ඇති පැමිණිල්ල අනුව පැමිණිලිකාරියගේ නිවසට ගල් ගසා අනර්ථයක් සිදුකිරීමක් සම්බන්ධයෙන් හා පැමිණිලිකාරියට අතවර කිරීමක් සම්බන්ධයෙන් තොරතුරු කිසිවක් අනාවරණය වී නොමැති බවද දක්වා ඇත.

ඒ අනුව පැමිණිලිකාරිය අසත්‍ය පැමිණිල්ලක් කර ඇති බවට කරුණු අනාවරණය වූ බැවින් පැමිණිලිකාරියට එරෙහිව තඹුත්තේගම ම/උ1160/2016 යටතේ ගරු අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇති බවද, නමුත් පැමිණිලිකාරියට එරෙහිව ගරු අධිකරණයේ නඩු පවරා නැති බවද දක්වා ඇත.

**විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපතිගේ කරුණු දැක්වීම :-**

විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපති විසින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2016.09.19 වන දින පැමිණිලිකාරිය විසින් පහරදීමට තැත් කිරීමක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් කර ඇති බවත්, මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් විමර්ශනයක් තමා විසින් සිදුකළ බවත්ය. මෙම විමර්ශනයේදී පැමිණිලිකාරිය පහරදීමක් සිදුවූ බව ප්‍රකාශ කර රෝහල්ගතව ඇති බව දැනගත් බවත්, ඒ අනුව තඹුත්තේගම රෝහල වෙත ගොස් පැමිණිලිකාරිය සමඟ කතා කළ බවත්ය. එසේම මෙම පැමිණිලිකාරිය වෙත 655/16 දරණ අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමය නිකුත් වී ඇති බවද පැමිණිලිකාරියට අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාව පොලිසිය වෙත ලැබී ඇති බවද, එම වෛද්‍ය වාර්තාවේ කිසිදු තුවාලයක් නොමැති බවට එහි සටහන්ව ඇති බවත් දක්වා ඇත. වගඋත්තරකරු විසින් සිදුකළ විමර්ශනයේදී පැමිණිලිකාරියට පහරදීමක් සිදුව ඇති බවට කරුණු අනාවරණය වී නොමැති බවද, මෙකී කරුණු අනුව මෙම පැමිණිලිකාරිය ව්‍යාජ පැමිණිල්ලක් ඇති බවට කරුණු අනාවරණය වී ඇති බැවින් පැමිණිලිකාරියට එරෙහිව ගරු අධිකරණය වෙත කරුණු වාර්තා කළ බවද දක්වා ඇත. ඒ අනුව මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් දෙපාර්ශවය කැඳවා විභාගයක් කිරීම අවශ්‍ය නොවූ බැවින් පැමිණිලි විභාගයක් සිදුකර නොමැති බවද වැඩිදුරටත් දන්වා ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිල්ලෙන් දක්වා ඇත්තේ, පැමිණිලිකාරියට සිදුව ඇති අසාධාරණයක් සම්බන්ධයෙන් පොලිසිය වෙත කරන ලද පැමිණිල්ලට සාධාරණ පරීක්ෂණයක් සිදුනොකර, එම පැමිණිල්ල අසත්‍ය පැමිණිල්ලක් බව ප්‍රකාශ කරමින් පැමිණිලිකාරියට එරෙහිව ගරු අධිකරණය වෙත කරුණු වාර්තා කරමින් වගඋත්තරකරුවන් අසාධාරණයක් සිදුකර ඇති බවය.

වගඋත්තරකරුවන් මේ සම්බන්ධයෙන් ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකාරිය විසින් පොලිසිය වෙත කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකරන ලද බවත්, එම විමර්ශනයේදී පැමිණිලිකාරිය විසින් අසත්‍ය පැමිණිල්ලක් කර ඇති බවට කරුණු අනාවරණය වූ බැවින්, පැමිණිලිකාරිය සම්බන්ධයෙන් ගරු අධිකරණ වෙත කරුණු වාර්තා කර ඇති බවත්ය.

වගඋත්තරකරුවන් විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති උධෘත අනුව පැමිණිලිකාරිය 2016.09.19 දින තඹුත්තේගම පොලිසිය වෙත පැමිණිල්ලක් කර ඇති අතර, එම පැමණිල්ල මඟින් ඇය ප්‍රකාශ කර ඇත්තේ, ඉඩම් පරික්ෂණයක් සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නිලධාරින් පැමිණ අදාළ පරික්ෂණය සිදුකර ආපසු ගිය පසු නිමල් යන අය සහ පොඩ්ඩා නොහොත් ප්‍රියන්ත යන අයද පැමිණිලිකාරියගේ වත්තට පැමිණ පැමිණිලිකාරියව බිම පෙරලා අනතුරුව නිමල් යන අය පැමිණිලිකාරියගේ ඇඟ උඩට නැගි බවත්, අනතුරුව මෙම පුද්ගලයින් පැමිණිලිකාරියව මරණ බවට තර්ජනය කරන ලද බවත්ය. එමෙන්ම පැමිණිලිකාරියගේ නිවසට ගල් ගසා ඇති බවත්, නන්දාවති හා අනෝජා යන දෙදෙනා පැමිණිලිකාරියට පරුෂ වචනයෙන් බැන වැදුනු බවත් පැමිණිල්ලෙන් දක්වා ඇත. පැමිණිලිකාරියගේ මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් විමර්ශනයක් ආරම්භ කර ඇති අතර, එම විමර්ශනයේදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නිලධාරියෙකුගෙන් ප්‍රකාශයක් සටහන් කරගෙන ඇත. මෙම ප්‍රකාශය මඟින් අදාළ නිලධාරියා සඳහන් කර ඇත්තේ, තමා ඉඩමේ මායිම් පෙන්වාදීමේදි පැමිණිලිකාරිය විසින් ඇයගේ දුවට හා බෑණා වන නිමල් යන අයට දංකොටුවේ එවුන්ට ඉඩම් දෙන්නේ නැහැ කියා ප්‍රකාශ කළ බවය. දංකොටුවේ එවුන්ට හොඳ පාඩමක් උගන්වනවා යනුවෙන් ප්‍රකාශ කර පැමිණිලිකාරිය පාපැදියක නැග යන්න ගිය බවද දක්වා ඇත. පැමිණිලිකාරියගේ පැමිණිල්ලේ නම් සඳහන් දංකොටුවේ ගෙදර නිමල් යන අයගේ ප්‍රකාශයෙහි දැක්වෙන්නේ, මහවැලි නිළධාරින් පැමිණ වැට මායිම් පෙන්වාදුන් බවත්, එම අවස්ථාවේදි පැමිණිලිකාරිය එම නිලධාරින් ඉදිරියේ දංකොටුවේ එවුන්ට ඉඩම් දෙන්නේ නැහැ යැයි ප්‍රකාශ කළ බවත්, එම අවස්ථාවේදි ප්‍රියන්ත යන අය නොසිටි බවත්ය. නිමල් යන අය පැමිණිලිකාරියට බැණ නොවැදුනු බවද සඳහන් කර ඇත.

පැමිණිලිකාරියගේ පැමිණිල්ලේ සඳහන් ප්‍රියන්ත යන අය ප්‍රකාශ කර ඇත්තේ, 2016.09.19 දින මහවැලි නිලධාරින් පැමිණෙන විට ඔහු නිවසේ නොසිටි අතර, ඔහුගේ මව සමඟ ඔහු ගමනක් ගොස් සිටි බවය. පැමිණිලිකාරියගේ පැමිණිල්ලේ සඳහන් අනෝජා යන අය ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකාරිය තම මව බවත්, ඇය තම මවගේ මව සමඟ ජීවත්වන බවත්, තම ස්වාමියා නිමල් යන අය වන බවත්ය. මහවැලි අධිකාරියේ නිලධාරින් පැමිණ ගිය පසු තම මව වන පැමිණිලිකාරිය තමන්ට හා ස්වාමියාට 'දංකොටුවේ එවුන්ට ඉන්න දෙන්නේ නැහැ' කියමින් තර්ජණය කළ නමුත් වෙනත් කිසිදු දෙයක් සිදුනොවූ බවත්, නන්දාවති හා ප්‍රියන්ත යන අය එම අවස්ථාවේ නොසිටි බවත් සඳහන් කර ඇත.

පැමිණිලිකාරියගේ පැමිණිල්ලේ සඳහන් කරුණු හා වගඋත්තරකරුගේ විමර්ශනයේදි ලබා ගෙන ඇති කරුණු සලකා බැලීමේදී පැමිණිලිකාරියගේ පැමිණිල්ලේ සඳහන් වන ආරවුල සිදුව ඇත්තේ, පැමිණිලිකාරියගේ දියණිය අනොජා, දියණියගේ ස්වාමියා නිමල්, පැමිණිලිකාරියගේ සහෝදරයාගේ පුතා වන ප්‍රියන්ත, පැමිණිලිකාරියගේ සහෝදරයාගේ බිරිඳ නන්දාවති යන අය සමඟ වේ. මෙම ආරවුල ඇති වී ඇත්තේ, ඉඩමක් මුල්කරගෙන බවද නිරික්ෂණය වේ. එමෙන්ම මෙම ඉඩම් ආරවුල දෙපාර්ශවය අතර දීර්ඝ කාලයක සිට පවතින ආරවුලක් වන බවද නිරික්ෂණය වේ.

වගඋත්තරකරුවන් මේ සම්බන්ධයෙන් ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකාරිය විසින් පොලිසිය වෙත කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් දෙපාර්ශවය කැඳවා පැමිණිලි විභාගයක් සිදුනොකළ බවය. එයට හේතුව ලෙස දන්වා සිටින්නේ, වගඋත්තරකරුවන් විසින් සිදුකරන ලද විමර්ශනයේදී අදාළ පැමිණිල්ල සත්‍ය බවට කිසිදු කරුණක් අනාවරණය නොවූ බවත්, ලද සාක්ෂි මත මෙම පැමිණිල්ල අසත්‍ය බවට කරුණු අනාවරණය වූ බවත්ය. ඒ අනුව අසත්‍ය පැමිණිල්ලක් කිරීම සම්බන්ධයෙන් පැමිණිලිකාරියට එරෙහිව ගරු අධිකරණය වෙත කරුණු වාර්තාකළ බවද දක්වා ඇත.

වගඋත්තරකරුවන්ගේ විමර්ශනය සඳහා සහභාගී කරගෙන ඇත්තේ, පැමිණිලිකාරියගේ පැමිණිල්ලේ සඳහන් අයවලුන් පමණක් වන අතර, මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් වෙනත් බාහිර පාර්ශවයන්ගේ සාක්ෂි ලබාගෙන නොමැති බව නිරීක්ෂණය වේ. ඒ අනුව ආරවුලට සම්බන්ධ වූවායැයි ප්‍රකාශ කරන අයගේම ප්‍රකාශ මඟින් ලබාදී ඇති තොරතුරු මත පමණක් පදනම වගඋත්තරකරුවන් විසින් ගැටුම සම්බන්ධයෙන් තීරණයක් ගෙන ඇති බවක් නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන් විසින් සිදුකර ඇති විමර්ශනය අනුව පැමිණිලිකාරිය විසින් පොලිසිය වෙත හා රෝහල් පොලිසිය වෙත කර ඇති පැමිණිල්ලේ සඳහන් සියලුම කාරණා පැමිණිල්ලේ නම් සඳහන් කර ඇති විත්තිකරුවන් ප්‍රතික්ෂේප කිරීම මතම මෙම පැමිණිලිකාරියගේ පැමිණිල්ල අසත්‍ය පැමිණිල්ලක් බවට වගඋත්තරකරු විසින් තීරණය කිරීම සාධාරණ සහ යුක්ති සහගත නොවන ක්‍රියාවක් බව පෙනී යයි. වගඋත්තරකරු විසින් මෙම පැමිණිල්ල අසත්‍ය පැමිණිල්ලක් බව තීරණය කළද, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නිලධාරියා විසින් පොලිසිය වෙත කර ඇති ප්‍රකාශය අනුව පැමිණිලිකාරිය හා ඇයගේ විත්ති පාර්ශවය විසින් මෙදින ආරවුලක් නිර්මාණය කර ගැනීමට පෙළඹීමක් සිදුව ඇති බව නිරීක්ෂණය වන බැවින් පැමිණිලිකාරියගේ පැමිණිල්ලේ සඳහන් සියලුම කාරණා අසත්‍ය කාරණා බවට තීරණයකට එළඹීමට වගඋත්තරකරුවන්ගේ විමර්ශනය තුළින් කරුණු අනාවරණය නොවන අතර, පැමිණිලිකාරියට හෝ විත්ති පාර්ශවයට යම් අගතියක් සිදුව ඇති බවට කරුණු ගලපා ගැනීමට වගඋත්තරකරුවන්ගේ විමර්ශනයේ කරුණු පවතින බව පෙනී යයි.

**නිගමනය :-**

සාධාරණ තීරණයක් ගැනීමට වගඋත්තරකරුවන්ට හැකියාව පැවති හෙයින් පැමිණිලිකාරියගේ පැමිණිල්ල සම්බන්ධයෙන් දෙපාර්ශවය කැඳවා විභාගයක් සිදුකර වගඋත්තරකරුවන්ගේ තීරණය දෙපාර්ශවය වෙත ලබාදීම යුක්ති සහගත වන නමුදු එසේ නොකොට වගඋත්තරකරුවන්ගේ අවසන් තීරණය ලෙස පැමිණිලිකාරිය විසින් අසත්‍ය පැමිණිල්ලක් කළ බවට කරුණු දක්වමින් ගරු අධිකරණය වෙත පැමිණිලිකාරියට එරෙහිව කරුණු වර්තා කිරීමෙන් වගඋත්තරකරුවන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) හි සඳහන් 'නීතිය පසඳලීම සහ ක්‍රියාත්මක කිරීම, නීතියේ රැකවරණය සර්ව සාධාරණ විය යුත්තේය' යන මූලික අයිතිවාසිකම පැමිණිලිකාරිය සම්බන්ධයෙන් උල්ලංඝණය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, වගඋත්තර පාර්ශවයේ ක්‍රියාකලාපය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කොටදී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇත බැවින්, වගඋත්තර පාර්ශවය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීමට පොලිස්පතිවරයා විසින් පියවර ගත යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023. 02. 10 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මා.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunas
Commissioner
Human Rights Commission of Sr

පිටපත :

01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යංශය,
14 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ.

03. මානව හිමිකම් කොමිෂන් සභාව ප්‍රාදේශීය කාර්යාලය,
අනුරාධපුර

B/